# වයඹ ජනකලා පදනමේ
# පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

01 කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයට අයත් අලෙවි සහකාර තනතුරට (කොන්ත්‍රාත් පදනම) මත බඳවා ගැනීම.

පුරප්පාඩු සංඛ්‍යාව - 05 (පිරිමි අලෙවි සහකාර - 04 , කාන්තා අලෙවි සහකාර - 01 )

**අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල /දෙමළ, ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි විෂය ඇතුළුව එක්වරකදී විෂයන් 06 කින් සමත් වීම.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (පොදු පරීක්ෂණය හැර) සියලුම විෂයයන්ගෙන් එකවර සමත් වී තිබීම.

**තනතුරට අදාළ වෙනත් විශේෂිත සුදුසුකම්.**

- අවම වශයෙන් හය මාසික පරිගණක පාඨමාලාවක් හදුරා තිබීම.
- අලෙවිකරණය පිළිබඳ පාඨමාලාවක් හදුරා තිබීම.
- ඉංග්‍රීසි භාෂා කථන හැකියාව.
- වයස අවුරුදු 18 ට නොඅඩු 45ට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- වයඹ ජනකලා පදනමට අයත් ඕනෑම අලෙවි මධ්‍යස්ථානයක සේවය කිරීමේ හැකියාව.
- මනා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.
- පූර්වාසන්න වසර 03 ක කාලයක් තුළ වයඹ පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙක් විය යුතුය.

කොන්ත්‍රාත් කාලය අවුරුදු 01 වන අතර, ආයතනය විසින් සිදුකරනු ලබන වාර්ෂික සේවා කාර්ය සාධනය අනුව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම පිළිබඳව වයඹ ජනකලා පදනම විසින් සළකා බලනු ලැබේ .

**තනතුරට අදාළ මාසික දීමනාව.**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 අනුව කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයට අදාළ MA 1-2 ආරම්භක වැටුප රු.43,312.00 + ජීවන වියදම් දීමනාව රු.17,800.00 = රු.61,112

**සැ.යු.**

ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2026.03.10** වන දිනට ප්‍රථම (කළමනාකාර අධ්‍යක්ෂ, වයඹ ජනකලා පදනම, නුවර පාර, කුරුණෑගල ) යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් එවිය යුතුය. ලියුම් කවරයේ වම් පස කෙළවරේ අයදුම්කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය.

**කළමනාකාර අධ්‍යක්ෂ,**
**වයඹ ජනකලා පදනම.**

**දුරකථන අංකය - 037-2223720**